## 6 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග


### ශ්‍රී ලංකා ආර්ථිකයෙහි කෘෂිකර්මයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ භූ විෂමතාව, දේශගුණය හා පස කෘෂිකර්මයට හිතකර වීම නිසා ඈත අතීතයේ සිට ම කෘෂිකාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රසිද්ධ විය. වර්තමානයේ ද කෘෂිකර්මයට වැදගත් තැනක් හිමි වී ඇති බව පහත සඳහන් කරුණුවලින් පැහැදිලි වේ.

- ❒ මෙරට ශ්‍රම බලකායෙන් 32.7% කට පමණ කෘෂි අංශයෙන් රැකියා සපයා දීම.
- ❒ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි අංශයේ දායකත්වය 11.9%ක් පමණ වීම.
- ❒ අපනයන ඉපයීම්වලින් කෘෂි අංශයේ දායකත්වය 24.6%ක් පමණ වීම.
- ❒ ශ්‍රී ලංකාවේ භූමි පරිභෝගයෙන් වැඩි කොටසක් කෘෂිකාර්මික අංශයට හිමි වීම.
- ❒ ආහාර නිෂ්පාදනයට හා කාර්මික අමුද්‍රව්‍ය සැපයීමට දායක වීම.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2010

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයෙහි ප්‍රධාන අංග




6.1 රූපය

## යැපුම් කෘෂිකර්මය

ප්‍රධාන වශයෙන් පරිභෝජනය සඳහා කරන බෝග වගාවන් යැපුම් කෘෂිකර්මය යනුවෙන් සැලකේ. ශ්‍රී ලංකාවේ වී වගාව හා හේන් ගොවිතැන එහිදී ප්‍රමුඛත්වයක් ගනී.

### ශ්‍රී ලංකාවේ වී වගාව


දිවයිනේ තනි බෝගයක් ලෙස වැඩි ම බිම් ප්‍රමාණයක් යොදවා ඇත්තේ වී වගාවට යි. එය රටේ මුළු බිම් ප්‍රමාණයෙන් 42%ක් පමණ වේ.

### අවශ්‍ය භෞතික සාධක

- 21-32$^{0}$c උෂ්ණත්වය
- 1900mm පමණ වූ වර්ෂාපතනය
- ජලය රඳා පවතින දියළු මිශ්‍ර මැටි පස
- තැනිතලා බිම් ප්‍රදේශ (ජලය හොඳින් රඳවා තබා ගැනීමට හා පහසුවෙන් වගා කටයුතු කිරීමට)
- අස්වැන්න නෙළන කාලයට වියළි බව.
  (නුවරඑළිය දිස්ත්‍රික්කයේ සීමිත කොටසක් හැර ශ්‍රී ලංකාවේ අනෙක් සියලු ම ප්‍රදේශ වී වගාවට යෝග්‍ය යි.)

### වී වගා ප්‍රදේශ

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම වී වගා කරනු ලැබේ. වැඩි ම වගා බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද අඩු ම බිම් ප්‍රමාණය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද වේ. (6.1 සිතියම බලන්න.) තෙත් කලාපයේ වර්ෂා ජලයෙන් ද වියළි කලාපය වැඩි වශයෙන් ජල සම්පාදනයෙන් ද වගා කරනු ලැබේ.




6.1 සිතියම
වී වගා ප්‍රදේශ

### වගාව ආශ්‍රිත ගැටලු

- ගොවීන්ගේ ණයගැතිභාවය
- කුඹුරු ඉඩම් කට්ටි වී යාම.
- ස්වාභාවික ආපදා (ගංවතුර, නියගය)
- අඩු අස්වැන්න.
- වී අලෙවි කර ගැනීමේ දුෂ්කරතා.
- ශ්‍රමිකයින් වෙනත් අංශ කරා යොමු වීම.
- කුඹුරු ඉඩම් ගොඩ කිරීම.
- සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම භාවිත කිරීම.
- නිෂ්පාදන වියදම වැඩි වීම

### ප්‍රවණතා

- වගා ඉඩම් ප්‍රමාණය වැඩි වීම. (විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල පැවති යුදමය වාතාවරණය අවසන් වීම හා පොහොර සහනාධාර, වී මිලදී ගැනීම වැනි රාජ්‍ය ප්‍රතිපත්ති මෙයට හේතු වී ඇත.)
- පොහොර සහනාධාර ලබා දීම.
- වැඩි අස්වනු ලබා දෙන බීජ වර්ග භාවිතය. (උදා: BG. 366. LD 408 වැනි)
- නව තාක්ෂණය යොදා ගැනීම. (යාන්ත්‍රිකරණය)
- නව ගොවිතැන් ක්‍රම යොදා ගැනීම.

යැපුම් කෘෂිකර්මය යටතේ වී වගාවට අමතර ව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ බෝග වර්ග වගා කරනු ලැබේ. වියළි කලාපයේ වැඩි වශයෙන් කුරක්කන්, බඩ ඉරිඟු, අමු, මෙනේරි වැනි ධාන්‍ය වර්ගත් මුං, කව්පි වැනි අතිරේක ආහාර බෝගත් උඩරට හා පහතරට ප්‍රදේශවල එළවළු හා පලතුරු යනාදියත් වගා කර ඇත.

ක්‍රියාකාරකම 1

- ❖ ශ්‍රී ලංකාවේ සිතියමක වැඩි ප්‍රමාණයක් වී වගා කරන දිස්ත්‍රික්ක තුනක් හා නිෂ්පාදනය අඩු දිස්ත්‍රික්ක තුනක් ලකුණු කර නම් කරන්න.
- ❖ වී වගාව සඳහා නව තාක්ෂණය යොදා ගන්නා ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- ❖ ශ්‍රී ලංකාවේ වී ගොවියා මුහුණපාන ගැටලු ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.
- ❖ ශ්‍රී ලංකාවේ වී ගොවියා නගාසිටුවීම සඳහා වත්මන් රජය විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ග මොනවාද?

## හේන් ගොවිතැන

හේන් ගොවිතැන, ගොවි බිම වරින්වර මාරු කිරීමෙන් සිදු කරනු ලබන ගොවිතැන් ක්‍රමයකි. පොහොර යෙදීමෙන් තොර ව බෝග වගා කිරීමෙන් පසේ සාරවත් බව නැති වූ විට වගා බිම අතහැර අලුත් වගා බිමක් සොයා ගෙන යාම විශේෂ ලක්ෂණයකි.

⏩ ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මොණරාගල, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය වැනි දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් හේන් ගොවිතැන සිදු කෙරේ.

⏩ සාම්ප්‍රදායික හේන් ගොවිතැනෙහි මූලික ලක්ෂණ

- ❒ තනි තනි ව හෝ සාමූහික ව කැලෑ කපා ගිනි තැබීමෙන් ගොවි බිම සැකසීම.
- ❒ සතුන්ගෙන් ආරක්ෂාවට දඬුවැට ඉදි කිරීම.
- ❒ හේන් පිළිස්සීම.
- ❒ ඊසාන දිග මෝසම් වැස්ස ආරම්භයේ දී ම වගා කිරීම. තනි බෝග වගාවට වඩා බහු බෝග වගාව ප්‍රචලිත වීම.
- ❒ අස්වැන්න වැඩි කොටසක් පරිභෝජනය සඳහා යොදා ගැනීම.
- ❒ වියළි කලාපීය ප්‍රදේශවල ගොවීන් සුළු පිරිසකගේ ගොවිතැන් ක්‍රමයක් වීම.

⏩ ප්‍රවණතා

- ❒ අද සල ගොවිතැන ස්ථිර ගොවිතැන් ක්‍රමයක් බවට පරිවර්තනය වෙමින් පවතී. ගොවි බිමෙහි යන්ත්‍ර භාවිත කොට, පොහොර යොදා ව්‍යාපාරික කටයුත්තක් ලෙස මුදල් ආයෝජනය කරමින්, මිරිස්, ළූණු, සෝයා සහ ගර්කින් කෙසෙල් වැනි බෝග වගා කරනු ලැබේ. වියළි කලාපයේ සංවර්ධන ව්‍යාපාර නිසා ජල සම්පාදනය හේතු කොට ගෙන ස්ථිර ගොවි බිම් බවට පත් වෙමින් පවතී. බිම් මාරුව වෙනුවට බෝග මාරුව ද සිදු වේ.
- ❒ රජය මගින් රක්ෂිත ඉඩම්වල සල ගොවිතැන් ක්‍රමය තහනම් කර ඇති අතර පෞද්ගලික ඉඩම්වල හේන් වගාව පවත්වා ගෙන යාම.
- ❒ හේන් ගොවිතැනට විකල්පයක් ලෙස කෘෂි වන වගාව ප්‍රචලිත කිරීම.

ක්‍රියාකාරකම 2

- ❖ ශ්‍රී ලංකාවේ හේන් ගොවිතැන යන මැයෙන් විද්‍යාලයේ භූගෝලීය සඟරාවේ පළ කිරීමට ලිපියක් සකස් කරන්න.

## වාණිජ කෘෂිකර්මය

ප්‍රධාන වශයෙන් අපනයනය හෝ අලෙවිය පදනම් කර ගෙන කරනු ලබන කෘෂිකාර්මික කටයුතු වාණිජ කෘෂිකර්මය ලෙස හැඳින්වේ. යටත්විජිත පාලන කාලය තුළ දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද තේ, පොල්, රබර් හා සුළු අපනයන බෝග ඒ අතර ප්‍රධාන වේ.


## තේ වගාව

- වගා ප්‍රදේශ : මහනුවර, බදුල්ල, රත්නපුරය, නුවරඑළිය, මාතලේ, කෑගල්ල, ගාල්ල, මාතර, කළුතර දිස්ත්‍රික්කවල ව්‍යාප්ත වී ඇත. (6.2 සිතියම බලන්න.)

- අවශ්‍ය වන භෞතික සාධක
  - ❒ 15 - 27°c දක්වා උෂ්ණත්වයක් ඇති ප්‍රදේශ
  - ❒ ලෝම් හා ලැටරයිට් පස්
  - ❒ 1900 - 5460mm දක්වා අවුරුද්ද පුරා පැතිරුණු වර්ෂාව
  - ❒ ජලය බැස යන මඳ බෑවුම් සහිත බිමක්

- බලපාන ආර්ථික සාධක
  - ❒ ස්ථිර සේවක පිරිසක්
  - ❒ පරිවහන පහසුකම්
  - ❒ විශාල ප්‍රාග්ධනයක්
  - ❒ විදේශීය වෙළෙඳපොළ

- ප්‍රවණතා
  - ❒ කුඩා තේ වතු අංශයේ ඵලදායිතාව ඉහළ මට්ටමක පැවතීම.
    2010 වර්ෂයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 76.4%ක දායකත්වයක් මේ අංශය හිමි කර ගැනීම. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2010)
  - ❒ නැවත වගාවට නැඹුරු වීම.
  - ❒ රිකිලි තේ වගාව හඳුන්වා දීම.
  - ❒ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම.
  - ❒ තේ ශක්ති අරමුදල ආරම්භ කිරීම.
  - ❒ තේ කම්හල් නවීකරණය කිරීම.
  - ❒ තේ ආශ්‍රිත අපනයනය නවීකරණය වීම.
  - ❒ තේ ඉඩම් පෞද්ගලිකරණය වීම.
  - ❒ කුඩා ඇසුරුම් ක්‍රම
  - ❒ රසකාරක තේ නිෂ්පාදනය




**6.2 සිතියම**
**තේ වගා කරන ප්‍රදේශ**

ගැටලු
- ❒ යෙදවුම් මිල ඉහළ යාම.
- ❒ වෙනත් ආදේශක පානවලින් එල්ල වන තර්ජන. (කොකා කෝලා වැනි බීම වර්ග)
- ❒ ලෝක වෙළෙඳපොළට අලුතින් රටවල් එකතු වීමෙන් ඇති වන තරගකාරී බව.
  උදා:- කෙන්යාව, උගන්ඩාව, මලාවි
- ❒ පහතරට තේ කර්මාන්තයට ශ්‍රමිකයින් හිඟ වීම.
- ❒ සේවක ගැටලු.
- ❒ ස්වභාවික විපත් ඇති වීම (නියගය, නායයාම)

ක්‍රියාකාරකම 3

- ❖ ශ්‍රී ලංකාවේ තේ වගාව වැඩි බිම් ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක පහක් නම් කරන්න.
- ❖ ශ්‍රී ලංකාවේ නිපදවන තේ වර්ග නම් කරන්න.


## රබර් වගාව

- වගා ප්‍රදේශ

කෑගල්ල, කළුතර, රත්නපුරය, කොළඹ, ගාල්ල යන දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් ද, මාතලේ , මහනුවර, මාතර සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සුළු වශයෙන් ද ව්‍යාප්ත වී ඇත. (6.3 සිතියම)

- වගාවට බලපාන සාධක
  - $27^{0}c$ ආසන්න ඒකාකාර මධ්‍ය උෂ්ණත්වයක් තිබීම.
  - වර්ෂය පුරා පැතිරුණු 2000mm වැඩි වාර්ෂික වර්ෂාපතනය.
  - කබොක් මිශ්‍ර රතු පස.
  - බෑවුම් ප්‍රදේශ තිබීම.

- ගැටලු
  - අඩු ඵලදාව.
  - ශ්‍රමික හිඟය.
  - නිෂ්පාදන වියදම අධික වීම.
  - අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ඇති වන බාධා
  - කෘත්‍රිම රබර් නිසා එල්ල වන තරගය
  - මිල උච්චාවචනය



6.3 රූපය
ශ්‍රී ලංකාවේ රබර් වගාව

- ප්‍රවණතා
  - 2010 වර්ෂයේ රබර් මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම.
  - දේශීය ඉල්ලුම වැඩි වීම. (ටයර්, ටියුබ්, පාවහන්, සෙල්ලම් බඩු ආදියට)
  - උපදේශන සේවාවන් පුළුල් වීම මගින් රබර් නැවත වගාවට පෙළඹීමට හා අලුත් වගාවට සුදානම් වීම. (2005 රබර් නැවත වගාව හෙක්ටයාර් 1,448කි. :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2005)
  - මෙතෙක් රබර් වගා නො කරන ලද මොනරාගල දිස්ත්‍රික්කයේ ද රබර් වැවීම ආරම්භ කිරීම. වසර 10ක් තුළ මොනරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 40,000ක රබර් වගා කිරීමට සැලසුම් කර ඇත.
  - කෘත්‍රිම රබර් නිෂ්පාදන වියදම වැඩි වීම (ඛනිජ තෙල් මිල ඉහළ යාම) නිසා ස්වාභාවික රබර්වලට ඉල්ලුම වැඩි වීම.
  - ත්‍රී රෝද රථ සඳහා ටයර් නිෂ්පාදනයට පෙළඹීම.
  - තුරුණු ශක්ති රබර් සමිති පිහිටුවීම.
  - කැනඩාව වැනි රටවල් සමග රබර් ගිවිසුම් ඇරඹීම හේතුවෙන් නව වෙළෙඳපොළවල් ඇති වීම.


## පොල් වගාව

දේශීය පරිභෝජනය සඳහා ඈත අතීතයේ සිට ම පොල් වගාව පැවති නමුත් එය වාණිජ බෝගයක් ලෙස ව්‍යාප්ත වූයේ යටත්විජිත පාලන සමයේ දී ය.

- පොල් වගා ව්‍යාප්තිය

කොළඹ, කුරුණෑගල හා හලාවත යන නගර සම්බන්ධ කරන පොල් ත්‍රිකෝණය නමින් හඳුන්වන කලාපය ප්‍රධාන වගා ප්‍රදේශය යි. රන්න, මිද්දෙණිය, තංගල්ල ආශ්‍රිත ප්‍රදේශය සුළු පොල් ත්‍රිකෝණය ලෙස වැදගත් වේ. ඒ හැර කොළඹ සිට තංගල්ල දක්වා වෙරළබඩ පටු තීරයක් ඔස්සේ ද මඩකලපුව හා යාපනය අර්ධද්වීපයේ ද වියළි කලාපයේ භූගත ජලය ඇති ප්‍රදේශවල ද සුළු වශයෙන් වගා කෙරේ. (6.4 සිතියම බලන්න.)

- බලපාන සාධක
  - ❒ උෂ්ණ තෙත් දේශගුණයක් පැවතීම.
  - ❒ $20^0$ - $27^0$c දක්වා උෂ්ණත්වය
  - ❒ වාර්ෂික ව 2000 - 2500mm අතර පැතිරුණු වර්ෂාපතනයක්
  - ❒ මීටර් 300ට වඩා පහත් බිම්
  - ❒ ලුණු මිශ්‍ර වැලි පසක් තිබීම
  - ❒ මිනිස් ශ්‍රමය
- ප්‍රවණතා
  - ❒ පොල් පර්යේෂණ ආයතනයේ කටයුතු පුළුල් කිරීම. (ලුණුවිල)
  - ❒ උපදේශන සේවා පුළුල් කිරීම.
  - ❒ ගෙවතු වගාවක් ලෙස සහනාධාර යටතේ පොල් වගා කිරීමට ජනතාව පෙළඹීම.
  - ❒ පොල් ඉඩම්වල අතුරු බෝග ප්‍රචලිත වීම. නිදසුන්: අන්නාසි, කෝපි, කෙසෙල්, ගම්මිරිස්.
  - ❒ නිෂ්පාදන විවිධාංගීකරණය.
  - ❒ වගා ණය ලබා දීම.
  - ❒ කෙටි කාලීන අස්වනු ලබා දෙන ගෙවතු පොල් පැළ හඳුන්වා දීම.




**6.4 සිතියම**

**පොල් හා වෙනත් අපනයන බෝග වගාවන්**

- ගැටලු
  - ❒ අඩු අස්වැන්න ලැබීම (විශේෂයෙන් කුරුණෑගල, ගම්පහ, පුත්තලම වැනි දිස්ත්‍රික්ක වල)
  - ❒ පලිබෝධ හා කෘමි උවදුරු ඇතිවීම (කුරුමිණි රෝගය)
  - ❒ දේශීය පරිභෝජනය වැඩි වීම නිසා අපනයනයට ඇති ප්‍රමාණය අඩු වීම.
  - ❒ පොල්තෙල්වලට ආදේශක වශයෙන් වෙනත් තෙල් වර්ග වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
  - ❒ පොල් ඉඩම් කැබලි කර විකිණීම.
  - ❒ දේශගුණික බාධා ඇතිවීම

ක්‍රියාකාරකම 4

❖ ශ්‍රී ලංකාවේ තේ, පොල්, රබර් යන ප්‍රධාන කෘෂිකාර්මික බෝග වගාවන් සංවර්ධනය සඳහා මෑතක සිට රජය අනුගමනය කරන ක්‍රියාමාර්ග වගුගත කරන්න.

ප්‍රධාන කෘෂි බෝග වගා සංවර්ධනයට ගෙන ඇති පියවර

| තේ | පොල් | රබර් |
|---|---|---|
| | | |

❖ ශ්‍රී ලංකාවේ රබර් හා පොල් ආශ්‍රිත කාර්මික නිෂ්පාදන නම් කරන්න.

❖ ශ්‍රී ලංකාවේ තේ, රබර් හා පොල් වගාවන් සඳහා යොදවා ඇති බිම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වීමට හේතු දක්වන්න.

## සුළු අපනයන බෝග

තේ, පොල්, රබර් යන ප්‍රධාන අපනයන බෝගවලට ලෝක වෙළෙඳපොළෙහි ලැබෙන මිල උච්චාවචනය වීම නිසා ඒ මත ම බලාපොරොත්තු තබා ගැනීම අවදානම් සහිත විය. ඒ නිසා මීට අමතර වෙනත් අපනයනයන් පිළිබඳ රජයේ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයන විවිධාංගීකරණ වැඩපිළිවෙළ ආරම්භ විය. ඒ යටතේ කොකෝවා, කෝපි, කුරුඳු, කරදමුංගු, ගම්මිරිස්, සාදික්කා වැනි බෝග වර්ග වගා කොට අපනයනය සඳහා කටයුතු සලසන ලදී. මෙම බෝග වර්ග සුළු අපනයන බෝග නම් වේ. පසු අවධියේ දී මල් වගාව, විසිතුරු පැළ වගාව, කජු, පලතුරු, බුලත් වැනි වගාවන් ද සුළු අපනයන බෝග යටතේ සංවර්ධනය විය.

### වගාවන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ

- ගම්මිරිස් - මහනුවර, මාතලේ, කෑගල්ල, ගම්පහ, කුරුණෑගල
- කරදමුංගු - මාතලේ, මහනුවර, රත්නපුරය
- කරාබු නැටි - මහනුවර, මාතලේ, කෑගල්ල
- සාදික්කා - මාතලේ, මහනුවර, රත්නපුරය
- කොකෝවා - මාතලේ, මහනුවර
- කෝපි - කළුතර, ගම්පහ, කෑගල්ල, රත්නපුරය
- කජු - මන්නාරම, හම්බන්තොට, පුත්තලම, අම්පාර, මොණරාගල
- කුරුඳු - මීගමුව සිට මාතර දක්වා වෙරළ තීරය හා රත්නපුර දිස්ත්‍රික්කය
- පැඟිරි - මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල කඩින් කඩ විහිදී ඇත. (6.4 සිතියම බලන්න.)

### ප්‍රවණතා

- සුළු අපනයන බෝග සඳහා ණය ආධාර ලබා දීම.
- විසිතුරු පැළ හා මල් වගා අංශයේ දියුණුවක් ඇති වීම.
- භූමි අලංකරණය, නිවාස හා හෝටල් අලංකරණය, උත්සව සඳහා මල් භාවිතය වැඩි වීම හේතුකොට ගෙන දේශීය හා විදේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුම වැඩි වීම.
- සුළු අපනයන අංශයේ සමස්ත ආදායම් වැඩි වීමක් දක්නට ලැබීම.
- අපනයනය සඳහා රජයේ සැලසුම් - සජ්තා ගිවිසුම.
- පොල් වගාව යටතේ අතුරු වගාවක් ලෙස සුළු අපනයන බෝග වගා කිරීම.
- 1998 කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයෙන් ආරම්භ කළ දෙවැනි බහු වාර්ෂික බෝග ව්‍යාපෘතිය මගින් පලතුරු, කුළු බඩු, මල් හා විසිතුරු පැළ සඳහා ආධාර ලබාදීම..

> **ක්‍රියාකාරකම 5**
>
> - ශ්‍රී ලංකාවේ වගා කරන සුළු අපනයන බෝග පිළිබඳ ලේඛනයක් පිළියෙල කරන්න.
> - සුළු අපනයන බෝග ව්‍යාප්ත වූ ප්‍රදේශ ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කර නම් කරන්න.
> - වී, තේ, රබර්, පොල්, පොල් හා සුළු අපනයන භෝග ආශ්‍රිත පර්යේෂණ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කර නම් කරන්න.
> - ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුළු අපනයන බෝග වගාවන්ගෙන් ලැබෙන දායකත්වය පිළිබඳ තොරතුරු රැස් කරන්න.

## සත්ත්වපාලනය

අතීතයේ සිට ම සත්ත්වපාලනය ශ්‍රී ලාංකිකයන්ගේ වැදගත් කෘෂිකාර්මික කටයුත්තක් විය. මී ගවයින් හා එළ ගවයින් ඇති කිරීම එහි ලා ප්‍රමුඛත්වයක් ගත්තේ ය. මේ වන විට ඌරන්, එළුවන්, බැටළුවන් හා කුකුළන් ඇති කිරීම සත්ත්වපාලනය ක්ෂේත්‍රයෙහි වැදගත් තැනක් හිමි කර ගෙන ඇත. මේ සතුන්ගෙන් කිරි, මස් හා බිත්තර ආහාර සඳහා ලබා ගන්නා අතර මළ අපද්‍රව්‍ය ජීව වායු හා පොහොර නිෂ්පාදනය සඳහා ද යොද ගැනේ.

### ගවයින්

- එළ හා මී ගවයින්ගෙන් 70%ක් පමණ වියළි කලාපයේත්, 30%ක් තෙත් කලාපයේත් ව්‍යාප්ත වී ඇත. 2000 පශු සංගණනයට අනුව ගවයින් මිලියන 1.5ක් ද මී හරකුන් මිලියන 0.7ක් ද වූ බව සඳහන් වේ.

- ❒ මී හරකුන් හා එළගවයින් සී සෑම, ගොයම් පෑගීම, බර ඇද ගෙන යාම වැනි කටයුතු සඳහා ගොවීන්ට උදව් වන අතර කිරි නිෂ්පාදනයට ද දායක වේ.
- ❒ වර්තමානයේ කිරි නිෂ්පාදන කලාප ගණනාවක් ඇත. එනම්, කඳුරට, මැදරට, පොල් ත්‍රිකෝණය, වියළි කලාපය, යාපනය අර්ධද්වීපය හා අන්තර් කලාපය යනුවෙනි. මෙම ප්‍රදේශවල ජීවත් වන කිරි ගොවීන් මුහුණ දෙන ගැටලු මගහරවා ඔවුන් දිරිමත් කිරීම සඳහා කිරි ගොවීන් සවිබල ගැන්වීමේ නියමු ව්‍යාපෘතියක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලදි. ඊට අමතර ව මහනුවර, නුවරඑළිය, මාතලේ බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, කෑගල්ල, ගම්පහ, පුත්තලම, මාතර, අම්පාර, හම්බන්තොට, මොණරාගල හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මේ යටතේ ආරම්භ වන කිරි ගොවි සමිති මගින් මින් ඉදිරියට රජයේ සහනාධාර සැපයේ. (2010 වසරේ සමස්ත කිරි නිෂ්පාදනය ලීටර් දස ලක්ෂ 247.6 කි.. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2010)
- ❒ කිරිවලින් කිරිපිටි, කල් කිරි, යෝගට්, මුදවාපු කිරි, වෙඬරු, කේජු ආදිය නිපදවයි.
- ❒ හරක් මස් සඳහා ම ගවයින් ඇති කිරීම නො කළ ද මස් පිණිස ගවයින් විකිණීම සිදු වේ. ආගමික සමාජයීය සංවිධානවලින් කරනු ලබන දැනුවත් වීම මත වර්තමානයේ ගව මස් සඳහා ඇති ඉල්ලුම අඩු වීමක් දක්නට ලැබේ.

### ⏩ ඌරන්

ඌරු ගොවිපළවල් පවත්වා ගෙන යාම ශ්‍රී ලංකාවේ මුහුදුබඩ සත්ත්ව පාලන තිරුවේ ප්‍රචලිත වී ඇත. ගම්පහ දිස්ත්‍රික්කය ප්‍රමුඛ වන අතර පුත්තලම, කුරුණෑගල, කොළඹ, කළුතර යන දිස්ත්‍රික්කවල ද ඌරන් ඇති කරනු ලැබේ. මස් ලබා ගැනීම මූලික අරමුණ යි. රාජ්‍ය අංශයේ ගොවිපළවල හා පෞද්ගලික ගොවිපළවල ඌරන් ඇති කෙරේ.

### ⏩ එළුවන්

- ❒ යාපනය, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් එළුවන් ඇති කෙරේ. පුත්තලම 'කොට්ටුකච්චිය' නම් ස්ථානයෙහි එළු ගොවිපළක් ඇත.
- ❒ එළුවන්ගෙන් 10%ක් පමණ කිරි ගැනීම සඳහා ද 90%ක් මස් පිණිස ද යොදා ගැනේ. ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයක වුව ද එළුවන් ඇති කළ හැකි වේ.

### ⏩ කුකුළන්

- ❒ වයඹ පළාතේ, පුත්තලම, කුරුණෑගල සහ බස්නාහිර පළාතේ කළුතර යන දිස්ත්‍රික්කවලින් ආවරණය වන කුකුළු පාලන බිම් තිරුව (poultry belt) තුළ කුකුළු පාලනය ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත ව පවතී.
- ❒ මහනුවර, මාතලේ, ගම්පහ, කොළඹ, හම්බන්තොට දිස්ත්‍රික්කවල ද කුකුළු පාලනය සිදු කෙරේ.
- ❒ මෑතක සිට කුකුළන් ඇති කිරීම වාණිජ මට්ටමින් වර්ධනය වී ඇත. පෞද්ගලික අංශය මෙහි දී ප්‍රමුඛත්වයක් ගනී. ප්‍රාග්ධන සුක්ෂම අභිජනන ගොවිපළවල්, කුකුළු කෑම නිෂ්පාදනාගාර, මස් පිණිස කුකුළන් ඇති කිරීම, බිත්තර නිෂ්පාදනය සඳහා ශ්‍රම සුක්ෂම විධි භාවිත කිරීම දක්නට ලැබේ.
- ❒ කුකුළු ගොවිපළ වෙළෙඳ කුටි නොහොත් 'ෆාම් ෂොප්', සිල්ලර අලෙවි වෙළෙඳ සැල් රට පුරා ආරම්භ වීමෙන් රැකියා අවස්ථා සැලසේ. (2010 වසරේ කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 10,416,000කි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2010)

### ⏩ සත්ත්වපාලනය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන අයුරු

- ❒ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයෙහි වැදගත් අංශයක් වීම.
- ❒ ග්‍රාමීය අංශයේ ස්වයං රැකියා උත්පාදනයට දායක වීම.
- ❒ ජනතාවගේ පෝෂණ මට්ටම නංවාලීම.
- ❒ අතුරු කර්මාන්ත මගින් අතිරේක ආදායම් මාර්ග ලබා දීම.
- ❒ ගොවිපළවලට පොහොර සපයා දීම.
- ❒ කිරි ආහාර නිෂ්පාදනය තරගකාරී මට්ටමක පැවතීමෙන් ආදායම වැඩි වීම.

ක්‍රියාකාරකම 06


❖ ශ්‍රී ලංකාවේ සත්ත්වපාලන ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු හා ඒවාට යොදා ඇති පිළියම් පිළිබඳ කරුණු රැස් කරන්න.

## ධීවර කර්මාන්තය හා මත්ස්‍ය වගාව

- ධීවර කර්මාන්තය වැදගත් ආර්ථික කටයුත්තක් වීමට හේතු
  - ❒ ජනතාවගේ පෝෂණ තත්ත්වය නංවාලීම.
  - ❒ සේවා නියුක්තියට ඉඩකඩ ලැබීම.
  - ❒ විදේශ විනිමය ඉපැයීම.
  - ❒ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලැබීම.

- හිතකර වූ භූගෝලීය සාධක
  - ❒ දිවයින වටා පිහිටි වෙරළ තීරය.
    21756$km^2$ ක් වූ නොගැඹුරු මහාද්වීප තටාකයක් තිබීම.
  - ❒ මත්ස්‍ය ආහාර බහුල වීම.
  - ❒ කඩතොළු සහිත වෙරළක් තිබීම.(ධීවර යාත්‍රා නවතා තැබීමට හා වරාය සඳහා)
  - ❒ කඩතොළු වෙරළ ආශ්‍රිත කලපු
  - ❒ ගංගා, වැව් හා අභ්‍යන්තර ජලාශවල මිරිදිය මසුන් බෝ කළ හැකි වීම.
  - ❒ ශ්‍රී ලංකාවට හිමි 340km විශාල වූ අනන්‍ය ආර්ථික කලාපය

- ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ තුනකි.
  1. අභ්‍යන්තර ධීවර කර්මාන්තය (මිරිදිය)
  2. මුහුදු ආශ්‍රිත ධීවර කර්මාන්තය (කරදිය)
  3. කිවුල් දිය ධීවර කර්මාන්තය (කලපු, බොකු ආශ්‍රිත ව)




6.5 රූපය
මත්ස්‍ය අභිජනන හා පර්යේෂණ මධ්‍යස්ථාන

## අභ්‍යන්තර ධීවර කර්මාන්තය (මිරිදිය)

- ❒ රට අභ්‍යන්තරයේ වැව් ආශ්‍රිත කෘත්‍රිම ජලාශවල මාළු ඇති කිරීම හා ඒ ආශ්‍රිත මසුන් ඇල්ලීම මීට අයත් ය.
- ❒ ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර මධ්‍යස්ථාන 6.5 සිතියමෙන් දැක්වේ. එම මධ්‍යස්ථානවල බෝ කරන මත්ස්‍ය පැටවි දිවයිනේ වැව්වලට මුදා හැරීම සිදු කෙරේ.
- ❒ කරදිය මාළුවලට වඩා මිරිදිය මාළුන්ගේ පෝෂණ ගුණය වැඩියෙන් ඇතැයි යන විශ්වාසය මත මිරිදිය මත්ස්‍ය ඉල්ලුම වැඩි වෙමින් පවතී.
- ❒ අභ්‍යන්තර මත්ස්‍ය නිෂ්පාදනය (ජලජීවී හා මිරිදිය) 2010 වර්ෂයේ මෙට්‍රික් ටොන් 51,000කි. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2010)
- ❒ තිලාපියා, ගුරාමි, කොරලි, ලූලා, මගුරා, කනයා වැනි මසුන් වැදගත් වේ.

## කරදිය ධීවර කර්මාන්තය

- ❒ ශ්‍රී ලංකාවට අයත් ආර්ථික මුහුදු සීමාව වෙරළේ සිට 340kmක් පළල් ය. එම කලාපය තුළ ධීවර සම්පත්වල අයිතිය රජයට හිමි වේ.
- ❒ කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ දෙකකි.
  1. මහාද්වීප තටාක හෙවත් වෙරළාසන්න ධීවර කර්මාන්තය
  2. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය (වෙරළේ සිට 40km ඈත මුහුද)

- වෙරළාසන්න ධීවර කර්මාන්තය
  - ❒ කරදිය මත්ස්‍ය නිෂ්පාදනයෙන් 90%ක් පමණ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙන් නිපදවනු ලැබේ. එහි මසුන් බහුල වීමට හේතු රාශියකි.
    - නොගැඹුරු නිසා හොඳින් හිරු එළිය ලැබීම.
    - ප්ලැන්ක්ටන් සත්ත්ව ආහාර බහුල වීම.
    - ගංගාවලින් මත්ස්‍ය ආහාර ගෙන ඒම.
    - මේ ප්‍රදේශවලින් හාල්මැස්සා, සාලයා, හුරුල්ලා, සූඩයා වැනි කුඩා මසුන් ඇල්ලීම සිදු කෙරේ.


- ගැඹුරු මුහුදේ ධීවර කටයුතු

  - මේ ප්‍රදේශයේ ධීවර සම්පත් රාජ්‍ය අනුග්‍රහය මත ප්‍රයෝජනයට ගැනේ.
  - බහුදින ධීවර යාත්‍රා යෙදවීමෙන් තෝරා, පරා, කෙලවල්ලන්, බලයන් වැනි මසුන් ඇල්ලීම සිදු කෙරේ.
  - වරාය පහසුකම් වැඩි කිරීම, පර්යේෂණ හා පුහුණු කිරීම් මෙන් ම උපකාරක සේවා සැපයීම මගින් ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනයට කටයුතු යොදා ඇත.
  - නවීන උපකරණ යොද ගැනීම.

- කිවුල් දිය ධීවර කර්මාන්තය
  - කලපු, බොකු වැනි කරදිය පිරුණු ජලාශ ආශ්‍රිත ව ව්‍යාප්ත ව ඇත.
  - ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන් වැනි මසුන් ඇල්ලීම සිදු කෙරේ.
  - සාගරයට ආසන්න ඇතැම් ප්‍රදේශවල (පම්බල, පිටිපන වැනි කෘත්‍රිම ජලාශවල ඉස්සන් වගාව බහුල ව සිදු වේ.
  - විදේශ විනිමය උපයන මාධ්‍යයකි.
  - මීට අමතර ව ගෘහාශ්‍රිත ව විසිතුරු මත්ස්‍ය වගාව ස්වයං රැකියාවක් ලෙස ද විනෝදාංශයක් ලෙස ද විදේශ විනිමය ඉපයීමේ මාර්ගයක් ලෙස ද වැදගත් වී ඇත.

- ගැටලු

  - ධීවර කාර්මිකයාගේ අඩු ආදායම හා ණයගැතිභාවය.
  - ධීවර ආම්පන්න හිගය.
  - නුපුහුණු ශ්‍රමිකයින් යෙදී සිටීම.
  - ඉන්ධන මිල ඉහළ යාම.
  - දිනෙන් දින අනෙකුත් ධීවර උපකරණ මිල ඉහළ යාම. (දැල්, බෝට්ටු)
  - වෙනත් රටවල ධීවරයින් අපේ මුහුදු සීමාවේ මසුන් ඇල්ලීම.
  - අවිනිශ්චිත වෙළෙඳපොළ තත්ත්වය.
  - ප්‍රවාහනය හා ගබඩා කිරීම පිළිබඳ ගැටලු
  - මෑතක දී ඇති වූ සුනාමි රළ පහර නිසා ධීවර කර්මාන්තය දැඩි පීඩනයකට ලක් වීම.




**6.6 සිතියම**
ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධීවර වරාය

මූලාශ්‍රය: මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය, පාසල් මුද්‍රණය

**ක්‍රියාකාරකම් 7**

- ❖ ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක, ප්‍රධාන ධීවර වරායන් පහක් ද, මිරිදිය ධීවර මධ්‍යස්ථාන තුනක් ද ලකුණු කර නම් කරන්න.
- ❖ ශ්‍රී ලංකාවේ ධීවරයින්ට බලපාන ගැටලු පහක් ලියන්න.
- ❖ ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් සංවර්ධනයට මෑතක සිට රජය අනුගමනය කරන උපාය මාර්ගයන් මොනවා ද?